හඳ රිදවන මතක සුවඳ

9

රෝහිත මුණසිංහ

ප්‍රංශයේ සිට

(පසුගිය කලාපයෙන්)

සමාජ පන්තීන් බෙදන සීමා මායිම් මේවායි යන මිනුම් දණ්ඩක් මට නැතත් ඔහු අයත් වූයේ මධ්‍යම පංතියේ ඉහළ ස්ථරයට හෝ සුළු ධනේශ්වර පංතියට විය හැකි ය. මාලිංගගේ පියා ඉඩම්හිමි වැව්ලි කරුවෙකි. ඔහුට අක්කර සිය ගණනක දේපළ හිමිව තිබිණ. මාලිංග ගේ පියා ප්‍රබල එක්සත් ජාතික පාක්ෂිකයෙකු වුවද තිබිණ. මාලිංග ගේ පියා ප්‍රබල එක්සත් ජාතික පාක්ෂිකයෙකු වුවද ඔහු එවකට පැවති යූ.අන්.පී. රජයේ ප්‍රබල ඇමතිවරයෙකු සමග ඉඩමකට නඩු කියමින් උන්නේ ය. තම වලව්වේ ගෙවත්තේ සිට ව්‍යායාම් කරන ඇමතිවරයා මාලිංගගේ පියා දුටුවිට "මිස්ටර්.... අර නඩුවෙන් ඔහේ පරාදයි. හරිද?" මාලිංගගේ පියා උත්තර දෙයි. මා එම සිද්ධිය සටහන් කරේ ඔවුන්ගේ සමාජ තත්ත්වය ගැන වටහා ගැනීම පහසු වනු පිණිස ය.

මව්සින් පක්ෂයට සම්බන්ධ කරන ලද වටිනාම පුද්ගලයා මාලිංග යයි මට සිතුණේ පක්ෂයේ ඉංග්‍රීසි පුවත්පත වූ රෙව්පවර් (Red Power) පත්තරයේ මුළු වගකීම මා මාලිංග හට පැවරුන විටදී ය. සැබවින්ම එහි ප්‍රධාන කතුවරයාද, සංස්කාරවරයාද ඔහුම විය. මාසයකට වරක් මුද්‍රණය කරන 'රෙඩ් පවර්' සකස් කිරීමේදී ඔහු සෘජුවම සම්බන්ධකම් පැවැත්වූයේ ලයනල් බෝපගේ සහෝදරයා සමග ය. මාලිංග ලයියා ගැන කථාකළේ පැහැදීමකිනි.

"සමහර වෙලාවට මම ලයියාගේ කාරෙකෙන් පත්තරේ වැඩවලට එහේ මෙහේ ගිහිල්ලා තියෙනවා. ලයියා කාරෙක එළවන වෙලාවල් වලටත් විමුක්ති ගී කියනවා" මාලිංග කියයි.

පත්තරයේ වැඩ කොළඹදී අවසන් කරගන්නට බැරි වුණාවිට සතියක් හෝ දින දහයක් නිවාඩු ලබාගන්නා මාලිංග ගමේ එයි. මාලිංග ගමේ පැමිණ ඇතිබවට මට ඔත්තුව දෙන්නේ ඔහුගේ එකම මල්ලිය. මම මාලිංග දැකීමට ඔහුගේ නිවසට යන්නෙමි. මා දැනසිටි පරිදි ඔහු හමුවීම සඳහා ඔහුගේ නිවසට ගිය එකම මිත්‍රයා ද මම විමි.

පුවත්පතේ වැඩ අවසන් වනතුරු ඔහු ගෙවන්නේ පුදුම හිතෙන ජීවිතයකි. කොණ්ඩය පීරීමක්, මුහුණ සේදීමක්, නෑමක් ඔහුට මතක්වෙන්නේවත් නැති ගානය. මාලිංග ඔහුගෙ " පැහැදිලි අත් අකුරුන්ම ලියූ පත්තරයේ පිටු එකින් එක මට පෙන්වන්නේ මහත් සතුටිනි. ඇතැම් විටක අන් හැමටම පෙර රෙඩ්පවර් කියවන පාඨකයා මම වන්නෙමි. මාලිංගගේ මේසය මත රයිම්, ඒෂියාවික්, ලංකා ගාඩියන්, ෆාර්ස්ටන් ඉකොනොමික් රිවිව් ආදී සඟරා ද කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වන 'ග්‍රැන්මා' පුවත්පත හා වෙනත් ඉංග්‍රීසි පුවත්පත් ද තිබේ.

මාලිංග බොහෝවිට අප නිවසට පැමිණෙන්නේ රාත්‍රී අට පසුවීමෙන් පසුව ය.

"හෙලෝ, සිස්ටර් බේබි හව් ආ යූ ?" නෑ කමකට ඔහුගේ අක්කා වන මගේ අම්මාගෙ "න් මාලිංග එසේ විමසන්නේ අපේ පවුලේ අය අම්මාට ආදරයට කියූ නම 'බේබි' වන නිසා ය. වස පුරා පත්තරයේ වැඩ කරමින් මොළේ වෙහෙස වූ නිසාදෝ දේශපාලනයට සම්බන්ධ බරෑරුම් මාතෘකාවලට නොඑළඹෙන ඔහු කැමතිවන්නේ හඬනගා සිනාසිය හැකි සැහැල්ලු කථාබහේ යෙදෙන්නට ය. අප දෙදෙනා බොහෝ විට වාඩි වී සිටින්නේ නිවසේ ඉදිරිපස ඇති දිගු පඩිය මත ය. වෙලාව ගත වී යන බවක් අප දෙදෙනාටම නොදැනෙයි. මහසයුර ඇති මහාවිදිය පත්තෙන් කරන්න රෝදයක් තරම් ලොකුවට ඉහළට ඇදී ආ හඳ දැන් අත්තේ අපේ ගිස් වලට ඉහළින් අපේ පිහාගත් තරම් කුඩාවටය. ගාලුපාරේ දෙපසටම දිවෙන වාහන ද බොහෝ සෙයින් තුනීවී අතර.

"ඒයි උඹට නිදිමත ද?" අත් ඔරලෝසුව දෙස බලන මාලිංග මගෙන් විමසයි.

"මම දොළහට යන්නම්. දැන් දොළහට කාලයි." ඔහු නැවත ද කියයි. නිවාඩු අවසන් වී කොළඹ යන තුරුම රාත්‍රී 8.00ට 9.00ට මා හමුවන්නට එන ඔහු නැවත ගියේ මධ්‍යම රාත්‍රියේ ය.

ඉංග්‍රීසි සාහිත්‍යය අතඹුලක්සේ ඉගෙන දැනසිටි ඔහුට කොතරම් කාව්‍යමය හා ගීතමය ලෙස බස හැසිරවීමේ පරිචයක්, හැකියාවත් තිබිණිද යන්නට හොඳම සාක්ෂියන් අද ද ඉතිරිව පවතියි. ඒ අනෙකක් නොව විමුක්ති ගී කැසට් පටියේ උපහාර කථනයේ ඉංග්‍රීසියෙන් කියවෙන කොටසයි. ඉංග්‍රීසි භාෂාවේ ඇති මටසිඳිවු, සොම්‍ය, කන්කලු වචන තෝරා බේරා ගනිමින් ශබ්ද රසය උද්දීපනය කරනු පිණිස උච්චාරණයේදී සමාන අයුරින් ශබ්ද වන වචන එකළඟ යොදා ගනිමින් ඔහු ඒ කෙටි ගද්‍ය කාව්‍ය නිර්මාණය කර ඇති සැටි අපූරු ය. ප්‍රශස්ථ ය. විශිෂ්ට ය. TRULY CHERISHED, BARBAPITY PARISHED (විරුළි චෙරිෂ්ඩ් - බාර්බැරිටි පැරිෂ්ඩ්) වැනි කන්කලු වචන යෙදූ එම ගද්‍ය කාව්‍යය මා ඉදිරියේ කියවමින් ඔහු මහත් සතුටක් වින්දේ ය. අද පවා මාසයකට වරක්වත් මා විමුක්ති ගී කැසට් පටය අසන්නේ මාලිංගලියා චිත්‍රා බෝපගේ ගේ හඬින් පිටිගත කළ එම හෘදයාංගම වචන ගොන්නශුවනය කේරිමේ නොනිවෙන ආශාවෙනි.

ප.වි.පෙ. සොයුරන්ට තිබූ මගේ බොළඳ සිතුවිල්ලක් බව මට වැටහී ගියේ පසුව ය.

වෘත්තියෙන් සනීපාරක්ෂක කම්කරුවෙකු වූ 'කුමානායක' සහෝදරයා රැකියාව කෙළේ 'වලාන' රජයේ රෝහලේ ය. විචාහකයෙකු වූ ඔහු සිය බිරිඳ හා දරුවන් සමග රෝහලට නුදුරුවම වූ නිල නිවසක පදිංචිව උන්නේ ය. සමාජවාදී කම්කරු සංගමයේ සාමාජිකයෙකු වූ 'කුමා' පක්ෂයට මහත් සේ භක්තිමත් වූ අතර පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකුට සිය ජීවිතය වුවත් දෙන තරමේ ආදරයක් දැක්වි ය.

කුමා මිටි ය. කාල වර්ණය. තරමක් විශාල දෙනෙතක් කිහිපවරක් ඔහුට කීවෙමි.

"බෑ බෑ ඔළුවටත් උඩින් කරන්න වැඩ තියෙද්දි අපේ මිනිස්සු පෝලිම්වල රස්තියාදු කරලා කොහොමද ? නිකම්ම ඉන්න අනිත් මිනිස්සුන්ටත් සමාජවාදය උදාකරලා දෙන්න මහන්සි වෙන මිනිස්සුන්ට අනිත් අය ඉඩ දෙන්න ඕන"

මා ඔහුට දොස් කී විට කුමා කියන්නේ එහෙමය.

පාවනය වැළඳුන මගේ මිත්තණිය ඇතුළු කරන ලද්දේ වලාන රෝහලට ය. මගේ මවගේ බාලම්මා වූ ඇය ළඟ සාත්තුවට නතර වූයේ ද මවය.

"පුතාගේ යාළුවා නම් හරි පුදුම මනුස්සයෙක්. ආච්චිට බඩ එළිය ගියපු විත්ත රෙදි මම එපා කියද්දිම අරගෙන ගිහිල්ලා හෝදලා, වේළලා ගෙනල්ලා දුන්නා."

අම්මා මට පැවසුවේ මා මිත්තණිය බලන්නට රෝහලට ගිය විටදීය. කුමාගේ බිරිඳ සිය සැමියාගේ දේශපාලන කටයුතු ගැන මුලදී දැක්වූයේ දැඩි විරුද්ධතාවකි. අප කුමාගේ නිවසට යන්නට එන්නට පටන් ගත්කල ඇය-ගේ විරුද්ධතාව තුනී වී ගියේ ය.

එක්තරා රාත්‍රියක තවත් සොයුරන් දෙදෙනෙකු සමග පෝස්ටර් අලවන්නට ගිය කුමා පොලිස් අත්අඩංගුවට පත්විය. ඔවුන් රාජ්‍ය විරෝධී පෝස්ටර් ඇලවූයේ යයි චෝදනා නැඟූ පොලිසිය තිදෙනාම උසාවියට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාරයට යැවී ය. අනෙක් සහෝදරයන් දෙදෙනා වූ 'බැනර්පි' හා 'ප්‍රේමකුමාර' තනිකඩයින් දෙදෙනෙකු වූයෙන් වැඩි බරපතළක් නොවූ අතර රජයේ සේවකයෙකුද, විචාහකයෙකුද වූ කුමානායක රිමාන්ඩ් වීම බරපතල විය.

මාසයක් පසු වෙන තුරුම ඔවුන්ට අපප නොලැබිණ. මා කුමාලා බැලීමට මාතර බන්ධනාගාරයට ගියවිට ඔහු හිටියේ මැළවුණ හේබාගිය මුහුණෙනි. රෝහලට ගොස් D.M.O. මහතා හමු වූ මම කුමාගේ රැකියාවට අනතුරක් නොවන ලෙස ක්‍රියිකරන්නැයි ඉල්ලා සිටියෙමි.

තම සැමියා බේරා දෙන්නැයි කියා හඬාගෙන කුමාගේ බිරිඳ අප නිවසට ආවා ය. එවිට නම් මා පත් වූයේ දැඩි අපහසු තත්ත්වයකට ය. දරු පවුල්කාරයන් ඔවැනි කටයුතුවලට ගාවා නොගන්නැයි මගේ මෑණියන් පවා මට දොස් කීවේ ය. පොලිසිය හා අධිකරණය ක්‍රියා කරන පක්ෂග්‍රාහී පිළිවෙත කියාදී අප ඇයට සැනසිලි බස් කීවෙමු. නිදහස් වී ආ පසුව කුමා පෙරටත් වඩා උනන්දුවෙන් පක්ෂයේ වැඩ කළේ "හිරේ විලංගුවේ දාලා මේ කුමානායක බය කරන්න බෑ" කියන්නාක් මෙනි.

එක් දිනක් කුමාත් මමත් පා ගමනින් නගරය දෙසට යමින් සිටියෙමු. ගෙවත්තේ සිටි මාලිංග මා දැක හඬ ගසා කථා කළේ ය. ඒ වනවිට කුමා මාලිංග ගැන අසා තිබිණ. මම ද කුමා ගැන ඇතැම් තොරතුරු මාලිංගට පවසා තිබුණෙමි.

(ලබන කලාපයට)

> "පුනාගේ යාළුවා නම් හරි පුදුම මනුස්සයෙක්. ආච්චිට බඩ එළිය ගියපු විත්ත රෙදි මම එපා කියද්දිම අරගෙන ගිහිල්ලා හෝදලා, වේළලා ගෙනල්ලා දුන්නා."
>
> අම්මා මට පැවසුවේ මා මිත්තණිය බලන්නට රෝහලට ගිය විටදීය.

> පුවන්පතේ වැඩ අවසන් වනතුරු ඔහු ගෙවන්නේ පුදුම හිතෙන ජීවිතයකි. කොණ්ඩය පීරීමක්, මුහුණ සේදීමක්, නෑමක් ඔහුට මතක්වෙන්නේවත් නැති ගානය. මාලිංග ඔහුගේ පැහැදිලි අත් අකුරුන්ම ලියූ පත්තරයේ පිටු එකින් එක මට පෙන්වන්නේ මහත් සතුටිනි. ඇතැම් විටක අන් හැමටම පෙර රෙඩ්පවර් කියවන පාඨකයා මම වන්නෙමි. මාලිංගගේ මේසය මත රයිම්, ඒෂියාවික්, ලංකා ගාඩියන්, ෆාර්ස්ටන් ඉකොනොමික් රිවිව් ආදී සඟරා ද කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවන්පත වන 'ග්‍රැන්මා' පුවන්පත හා වෙනත් ඉංග්‍රීසි පුවත්පත් ද තිබේ.